

බ්‍රේල් මාධ්‍ය අවශ්‍ය වේ.




ඡන්දය ප්‍රකාශ කිරීමේදී සහයකයෙක් අවශ්‍ය වේ.



සංඥා භාෂා සන්නිවේදකයෙකුගේ සහය අවශ්‍ය වේ.



රූප මාධ්‍ය තොරතුරු අවශ්‍ය වේ.

ආබාධ සහිත පුද්ගල සංවිධාන ඒකාබද්ධ පෙරමුණ.
නො 33,
රජ මාවත,
රත්මලාන.
දු.අ / ෆැ.අ - 011-2721383
විද්‍යුත්තැල් - dojf@sltnet.lk / dojfsl@gmail.com

# අන්තර්කරණය වූ මැතිවරණයක් සඳහා ආබාධ සහිත තැනැත්තන්ගේ දායකත්වය



ආබාධ සහිත පුද්ගල සංවිධාන ඒකාබද්ධ පෙරමුණ

## හැඳින්වීම

ආබාධ සහිත පුද්ගල සංවිධාන ඒකාබද්ධ පෙරමුණ ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා 2001 වර්ෂයේ දී ස්ථාපිත වූ ඒකඡත්‍ර සංවිධානයකි. මෙහි සාමාජික සංවිධාන ලෙස දෘශ්‍යාබාධ, ශ්‍රවණාබාධ, ශාරීරික ආබාධ සහ මානසික ආබාධ යන තත්ත්වයන් නියෝජනය කෙරේ. මේ ආකාරයෙන් ස්ථාපිත පළමු සහ එකම සංවිධානය ලෙස ආබාධ සහිත පුද්ගල සංවිධාන ඒකාබද්ධ පෙරමුණ හැඳින්විය හැකිය. මෙම සංවිධානය සාමාජික සංවිධාන 12 කින් ආරම්භ වී වර්තමානය වන විට සාමාජික සංවිධාන 30 කින් සමන්විත වේ. ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත්, වැඩි දියුණු කිරීමටත්, අවශ්‍ය අවස්ථාවන්වලදී මැදිහත්වී අයිතිවාසිකම් උල්ලංඝනයවී ඇති අවස්ථාවලදී එය ආරක්ෂා කිරීමටත් ආබාධ සහිත පුද්ගල සංවිධාන ඒකාබද්ධ පෙරමුණ බැඳී සිටී.

## දැක්ම

ආබාධ සහිත පුද්ගලයින්ගේ සංවිධාන වල ඒකාබද්ධ ශක්තිය මඟින් සමාන අයිතිවාසිකම් භුක්තිවිඳින සමාජයක්.

## මෙහෙවර

ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, සාක්ෂාත් කර ගැනීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ආබාධ සහිත පුද්ගලයින්ගේ සංවිධාන ශක්තිමත් කිරීම. සහයෝගීතාවයෙන් කටයුතු කිරීම අනෙක් සංවිධාන සමග ජාලගත කිරීම මඟින් උද්දේශනය කිරීමේ ක්‍රියාවලියක නිරතවීම.

## අරමුණ

ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත් නිදහස් හා ස්වාධීන වූ ජීවිතයක් ගත කිරීමටත් බලපෑම් කණ්ඩායමක් ලෙස ආබාධිත පුද්ගලයින්ගේ සංවිධාන එකමුතුව වැඩ කිරීම.



ඡන්ද මධ්‍යස්ථානය පරිශ්‍රයට ප්‍රවාහන පහසුකම් අවශ්‍ය වේ.



ඡන්දය ප්‍රකාශ කරන කුටිය සහ ඡන්ද පෙට්ටිය අඩු උසකින් තිබීම අවශ්‍ය වේ.



ඡන්ද මධ්‍යස්ථානය තුළ රෝද පුටුව භාවිතා කිරීම අවශ්‍ය වේ.




අකුරු විශාල කර පෙන්වීමේ උපකාරය අවශ්‍ය වේ.